# බලන්ගොඩ නගර සභාව
# ටෙන්ඩර් දැන්වීම

**2024 වර්ෂය සඳහා බලන්ගොඩ නගරයට රථ වාහන ඇතුළු කිරීම හා නැවතුම් ගාස්තු අය කිරීමේ අයිතිය බදුදීම සඳහා සුදුසු බදු කරුවන් තෝරා පත් කර ගැනීමට ටෙන්ඩර් පත් කැඳවීම.**

2024 ජනවාරි 01 වන දින සිට 2024 දෙසැම්බර් 31 වන දින දක්වා වර්ෂයක කාලයක් සඳහා පහත උපලේඛනයේ විස්තර කරනු ලබන දේපළ බදු දීම වෙනුවෙන් මුද්‍රා තබන ලද ටෙන්ඩර් අයදුම්පත් බලන්ගොඩ නගර සභාවේ ලේකම් සමරවීර හෙන්ඩ්‍රිලාගේ අමිතා කරුණාරත්න වන මා විසින් 2023 දෙසැම්බර් 20 වන දින පෙ.ව.10.00 දක්වා භාරගනු ලැබේ. වැඩි විස්තර සතියේ වැඩ කරන දිනයන්හි වැඩ කරන වේලාව තුල දි කාර්යාලීය දුරකථන අංක 045-4930830 ඇමතීමෙන් හෝ info@balangoda.uc.gov.lk වෙතින් ලබාගත හැකි ය.

**ටෙන්ඩර් පත් නිකුත් කිරීම:**
2023 දෙසැම්බර් මස 19 වන දින ප.ව. 3.00 දක්වා ටෙන්ඩර් පත් බලන්ගොඩ නගර සභා කාර්යාලයේ දී නිකුත් කරනු ලැබේ.

**ටෙන්ඩර් පත් භාරගැනීම:**
2023 දෙසැම්බර් මස 20 වන දින පෙ.ව.10.00 දක්වා ටෙන්ඩර් පත් භාර ගනු ලැබේ. ටෙන්ඩර් අයදුම්කරුවන් විසින් සම්පූර්ණ කර මුද්‍රා තබන ලද ටෙන්ඩර් අයදුම්පත් කාර්යාලයේ තැන්පත්කර ඇති ටෙන්ඩර් පෙට්ටියට අතින් ගෙනවිත් බහාලීම හෝ ලේකම්, බලන්ගොඩ නගර සභාව යන ලිපිනයට 2023 දෙසැම්බර් මස 20 වන දින පෙ.ව.10.00 ට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් හෝ යොමු කළ හැකි ය. නියමිත වේලාවට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**ටෙන්ඩර් පත් විවෘත කිරිම:**
2023 දෙසැම්බර් මස 20 වන දින පෙ.ව. 10.30 ට ටෙන්ඩර් පත් විවෘත කරනු ලැබේ. මෙම අවස්ථාවට ටෙන්ඩර් අයදුම්කරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයෙකුට සහභාගි විය හැකිය.

**උප ලේඛනය**

| අනු අංකය | ටෙන්ඩර් පත් කැඳවනු ලබන වෙළෙඳාමේ ස්වභාවය | ආපසු ගෙවනු ලබන ටෙන්ඩර් ඇප තැන්පත් මුදල | අයදුම්පත් ගාස්තුව | අවම මාසික ටෙන්ඩර් මුදල |
|---|---|---|---|---|
| 01. | බලන්ගොඩ නගරයට රථවාහන ඇතුළුකිරීම හා නැවතුම් ගාස්තු අයකිරීම | රු.20,000.00 | රු.1,000.00 | රු.120,180.00 |

**විශේෂ කොන්දේසි:**

- ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ තමා ඉදිරිපත් කරනු ලබන ලංසුවේ නම සඳහන් කළ යුතුය.
- ඉදිරිපත් කරන ලංසුවට අදාල ඉහත උප ලේඛනයේ සඳහන් ගාස්තු ද, රජය විසින් පනවනු ලබන බදු මුදල්ද ගෙවිය යුතුය.
- තෝරා ගන්නා ලද බදු කරු ගිවිසුම් ඇප තැන්පත් මුදල් වශයෙන් මාස තුනක කුලී මුදලට සමාන මුදලක් සභාවට ගෙවිය යුතු අතර, එය වාරික දෙකක් වශයෙන් බලන්ගොඩ නගර සභාවට ගෙවිය හැකිය. එම මුදලින් තුනෙන් එකක් නොහොත් මසක කුලිය බදුකරු තෝරා ගෙන පළමු පැය තුළ ගෙවිය යුතුය. එසේ නොගෙවන බදුකරුවන්ගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉතිරි කොටස් දෙක නොහොත් මාස දෙකක කුලිය එකවර ගෙවා 2023.12.29 දින වන විට ගිවිසුම් අත්සන් කළ යුතුය.
- සියලුම හෝ ඕනෑම ටෙන්ඩරයක් පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය බලන්ගොඩ නගර සභාවේ ටෙන්ඩර් මණ්ඩලය සතුය.

2023 දෙසැම්බර් මස 06 වන දින,
බලන්ගොඩ නගර සභාවේදීය.

එස්.එච්.ඒ. කරුණාරත්න,
ලේකම් හා බලතල, කාර්ය කර්තව්‍ය
ක්‍රියාත්මක කිරීමේ නිලධාරී,
බලන්ගොඩ නගර සභාව.